www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විදුලි බල ප්‍රතිසංස්කරන පනත සම්මත කරයි

## Sri Lankan parliament passes power reform bill

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2009 මාර්තු 12**

විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂනය හා බෙදාහැරීම යන සියලුම අංශවල දී රාජ්‍ය-සතු ලංකා විදුලි බල මන්ඩලය (ලංවිම) සමග තරග කිරීමට පුද්ගලික ආයතනවලට, සමූපකාර සමිතිවලට හා පලාත් පාලන ආයතනවලට ඉඩසලසමින්, ශ්‍රී ලංකා ආන්ඩුව මාර්තු 3 දා විදුලි බල පනත පාර්ලිමේන්තුව තුලින් සම්මත කර ගත්තේය.

මෙම පනත ලංවිම රැකියා අහිමි වීමට ද එහි සේවකයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි කප්පාදු කිරීමට ද නොවැලැක්විය හැකි ලෙස ම තුඩු දෙනු ඇත. පනත ඉදිරියට තල්ලු කරමින්, විදුලි හා බල ශක්ති ඇමති ජෝන් සෙනෙවිරත්න කියාපෑවේ ආන්ඩුව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට කටයුතු කරන බවයි. තථ්‍ය වසයෙන් ගත් කල, ප්‍රධාන වසයෙන් ම වාසි ලබනු ඇත්තේ ව්‍යාපාරිකයන් හා කර්මාන්තකරුවෝ ය. පසුගිය වසර තුල දී පමනක්, ආන්ඩුව සාමාන්‍ය නිවාස සඳහා විදුලි බල ගාස්තු සියයට 80කින් ඉහල දමා ඇත.

විදුලි බල සම්ප්‍රේශනය හා බෙදාහැරීම සඳහා ඉල්ලුම් කරන පුද්ගලික ආයතනවල කොටස්වලින් සියයට 51ක් ආන්ඩුව අත පැවතීම අවශ්‍ය කරවන සංශෝධනයකට සෙනෙවිරත්න එකඟවීමෙන් පසුව, වෘත්තීය සමිති ගනනාවක් ම සිය විරුද්ධත්වය ඒ වන විටත් ඉවත් කරගෙන තිබුනි. ආංශිකව පුද්ගලීකරනය කල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තුල රැකියා කප්පාදු මගින් පෙන්නුම් කෙරී ඇති පරිදි, එවන් වගන්තියකින් කම්කරුවන්ට කිසිදු ආරක්ෂාවක් සැපයෙන්නේ නැත.

ප්‍රධාන විපාර්ශ්වික පක්ෂ දෙක -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ එක්සත් ජාතික පක්ෂය (එජාප) -- සමග සම්බන්ධිත සමිති පමනක් පනතට එරෙහිව උද්ඝෝෂනයක් පැවැත්වූහ. මාර්තු 2 දා, ජවිපෙ විසින් මෙහෙයවනු ලබන එක්සත් වෘත්තීය සමිති පෙරමුන (එවෘසපෙ) ලංවිම වැඩපොලවල කලු කොඩි එසවීය. එවෘසපෙ සහ එජාපයේ ජාතික සේවක සංගමය (ජාසේස) ලෙඩ නිවාඩු දමා මාර්තු 3 දා විරෝධතා ව්‍යාපාරයට සහභාගි වන ලෙස සිය සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටියහ.

මෙම සීමිත විරුද්ධත්වයට පවා ආන්ඩුව දැක්වූ ප්‍රතිචාරය, ගෝලීය ආර්ථික අර්බුදය දිවයින මත බලපාන කල පොදුවේ වැඩ කරන ජනතාවට එරෙහිව සූදානම් කෙරෙමින් පවතින විධික්‍රම පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමකි. ලංවිම බලධාරිහු ලංවිම වැඩපොලවල කලු කොඩි එසවීම තහනම් කරමින් ද සේවකයන්ගේ නිවාඩු අවලංගු කරමින් ද වහාම චක්‍රලේඛ නිකුත් කලහ.

මාර්තු 2 දා, සිවිල් ඇඳුමින් සැරසුනු පොලිස් නිලධාරිහු සමිති ක්‍රියාකාරින් බියගැන්වීමේ ප්‍රයත්නයක් ලෙස ඔවුන්ගේ නිවෙස්වලට ගියහ. පසුදින, පාර්ලිමේන්තුව රැස්වෙමින් තිබිය දී, සැලසුම් කර තිබූ විරෝධතා පාගමනේ ආරම්භක හා අවසන් ස්ථාන වූ කොටුව දුම්රිය පොල සහ ලංවිම මූලස්ථානය අසල, මැනවින් සන්නද්ධ කොමාන්ඩෝ භටයන් ඇතුලු, 600ක පොලිස් බල ඇනියක් යොදවා තිබුනි.

එය ආරක්ෂාවට තර්ජනයක් මතු කරන බව කියමින් ද ආන්ඩුවේ යුද කාලීන හදිසි නීති බලතල යොදා ගන්නා බවට තර්ජනය කරමින් ද පොලීසිය කම්කරුවන්ගේ පාගමන වැලැක්වීය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය ප්‍රහාරයක් එල්ල කරනු පිනිස විරෝධතා ව්‍යාපාරය ගසාකෑමට සැලසුම් කරන බව ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් සමිති නායකයෙකුට පැවසීය. 1996 දී වර්ජක ලංවිම ඉංජිනේරුවන්ට එරෙහිව සිදු කල අයුරින් ම පොලීසිය බලය පාවිච්චි කරනු ඇතැයි ද ඔහු අනතුරු ඇඟවීය.

මුදල් සොයාගැනීමේ ද නය බරින් මිරිකී ඇති ලංවිම මූල්‍ය බර ලිහිල් කිරීමේ ද විධික්‍රමයක් ලෙස පනත සම්මත කරගැනීමෙහිලා ජනාධිපති මහින්ද රාජපක්ෂ මංමුලාසහගත විය. ඩොලර් බිලියන 1.9ක නය මුදලක් පිලිබඳව ආන්ඩුව සමග මේ දැන් සාකච්ඡා කරමින් සිටින ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අවධාරනය කරනු ලබන කොන්දේසි අතර බල ශක්ති අංශය පුද්ගලීකරනය ද තිබිය හැකිය.

2006 දී රට යලි යුද්ධයට ඇද දැමීමෙන් අනතුරුව, රාජපක්ෂ දැවැන්ත ලෙස ඉහල නැග ඇති මිලිටරි වියදම් පියවාගනු වස් විශාල වසයෙන් නයට ගෙන තිබේ. ගැඹුරු වන ගෝලීය ආර්ථික පසුබෑස්ම මධ්‍යයේ,

ආන්ඩුව අලුතෙන් නය ලබාගැනීමේ දුෂ්කරතාවට ද ප්‍රගාඪ ගෙවුම් ශේෂ අර්බුදයකට ද මුහුන දී සිටී. විදේශ විනිමය සංචිතය පසුගිය ජූලි මාසයේ තිබූ ඩොලර් බිලියන 3.56 සිට දෙසැම්බර් මාසය වන විට ඩොලර් බිලියන 1.75 දක්වා බැස්ස අතර එය ප්‍රමානවත් වන්නේ යන්තම් මාස එකහමාරක ආනයන සඳහා පමනි.

විදුලි බල පනත යටතේ, බල ශක්ති අංශයට සම්බන්ධිත සියලු ක්‍රියාකාරකම් සිදු කෙරෙනු ඇත්තේ පොදු පහසුකම් කොමිෂම (පීයූසී) වෙතින් ලැබෙන බලපත්‍ර යටතේය. 2003 දී එජාප නායකත්වයෙන් යුක්ත ආන්ඩුව විසින් පීයූසී පිහිටුවන ලද්දේ, එය සැලසුම් කල ලංවිම හා ජල සම්පාදන මන්ඩලය පුද්ගලීකරනයට පහසුකම් සලසනු පිනිසය. 2006 දී රාජපක්ෂ ආන්ඩුව රාජ්‍ය-සතු ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද එහි බල වපරිසයට ඇතුලු කලේය.

බල ශක්ති පුද්ගලීකරනය වසර 25ක් තිස්සේ ආන්ඩුවේ න්‍යාය පත්‍රය තුල පැවතී ඇත. ලංකා විදුලි බල සමාගම (ලෙකෝ) පිහිටුවීම මගින් එජාප 1983 දී ඒ සඳහා පලමු පියවර ගත්තේය. ආන්ඩුව අත එම සමාගමේ බහුතර කොටස් තිබූ නමුත් එයට පුද්ගලික කොටස්කරුවන් සිටි අතර එය දුවවනු ලැබුවේ ලාභ ලැබීමේ අවශ්‍යතාව මතය.

1996 දී, පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) සන්ධානය, මෙ.වො. 10ට අඩු පුද්ගලික ව්‍යාපෘති සඳහා අවසර දුන්, බල ශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් හරහා විදුලි බල උත්පාදනය පුද්ගලික අංශයට විවෘත කලේය. එම සීමාව පසුව මෙ.වො. 100 දක්වා ඉහල දමන ලදි. කෙසේවෙතත්, ජනවාරියේ දී, ආයෝජන මන්ඩලය, අවසානයේ දී මෙ.වො. 1000ක ධාරිතාවකින් යුක්ත වනු ඇති, පුද්ගලික බල ශක්ති උත්පාදන ආයතනයකට අවසර දුන්නේය.

2002 දී, එජාප නායකත්වයෙන් යුක්ත ආන්ඩුව ලංවිම විකුනා දැමීමේ පනතක් සම්මත කල නමුදු, කම්කරුවන් වෙතින් පැන නැගි විරෝධතාවන්ගෙන් පසුව එය පසෙක දැමීමට බල කෙරුනි. 2005 දී, ශ්‍රීලනිප නායකත්වයෙන් යුක්ත ආන්ඩුවක් සංශෝධිත පනත බලාත්මක කිරීමට උත්සාහ දැරූ නමුදු, අධිෂ්ඨානවත් විරුද්ධත්වයකට මුහුනු දුන් තතු යටතේ එය ද කල්දැමීමට බල කෙරුනි. ජවිපෙ එකල පාලක සභාගයේ ද කැබිනට් මන්ඩලයේ ද හවුල්කරුවෙක් විය.

2008 මාර්තුවේ දී පනත යලි යෝජනා කෙරුනු විට, සියලු වෘත්තීය සමිති එයට විරුද්ධ විය. කෙසේවෙතත්, සම්ප්‍රේශන හා බෙදාහැරීමේ ක්ෂේත්‍රවල දී ආන්ඩුවේ කොටස් සියයට 51ක් පවත්වාගැනීමේ සංශෝධනය සමිති එකිනෙක භේද කිරීමට සමත්විය. පාලක ශ්‍රීලනිපට අනුබද්ධිත නිදහස් සේවක සංගමය, පාලක මැදිරි සේවක සංගමය, නව සමසමාජ පක්ෂයට (නසසප) අනුබද්ධිත බිල් නිලධාරින්ගේ සංගමය සහ ලංවිම ඉංජිනේරු සංගමය යන සියල්ලෝම පනතට සහයෝගය දුන්හ.

විදුලි බල කම්කරුවන්ගේ විරුද්ධත්වය ගසාකෑමට උත්සාහ කරමින්. එජාප හා ජවිපෙ අනුබද්ධිත සමිති -- ජාසේස සහ එවෘසපෙ -- උද්ඝෝෂනය දිගටම ගෙන ගියහ. එහෙත් එය ආරම්භයේ පටන්ම සීමිත එකක් විය. මෙම පක්ෂ දෙකම ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට සහාය දෙති. වර්ජනයක් කැඳවනවා වෙනුවට, ලෙඩ නිවාඩු දැමීමේ ව්‍යාපාරයක් පැවැත්වීමට ගත් තීන්දුව, ජවිපෙ සමිති නායක රන්ජන් ජයලාල් පැහැදිලි කල පරිදි, යුද ප්‍රයත්නයට බාධා නොකිරීම පිනිස ගත් එකක් විය.

ජයලාල්, පසුගිය සිකුරාදා පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ඉන්දියානු සමාගම්වලට බල ශක්ති අංශය අත්පත් කරගැනීමට දොර විවෘත කරන බවට ආන්ඩුවට චෝදනා කලේය. කෙසේවෙතත්, ඉන්දියානු කම්කරුවන් සහ ලොව පුරා බල ශක්ති කම්කරුවෝ, රැකියාවන්ට හා සේවා කොන්දේසිවලට තර්ජනය කරන මීට සමාන පුද්ගලීකරන පිලිවෙත්වලට මුහුන දී සිටිති. ජයලාල්ගේ වැනි ආර්ථික ජාතිකවාදී වාචාලත්වයන් මගින් කෙරෙන්නේ, කම්කරුවන් භේද කොට ඔවුන්ගේ පොදු පන්ති අවශ්‍යතා ආරක්ෂා කරන මොන යම් හෝ ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් කඩාකප්පල් කිරීම පමනි.

පුද්ගලීකරනය තුල ජවිපෙ හා එජාප වාර්තාව විවේචනය කරමින්, ආන්ඩුවේ පනතේ ප්‍රධාන අද්වකාත්වරයකු ලෙස අවස්ථාවාදී නසසප මතුවීම අර්ථභාරීය. එහි සමිතිය වන බිල් නිලධාරින්ගේ සංගමය පත්‍රිකාවක් නිකුත් කරමින්, පනතේ සංශෝධන කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් "විදුලි බල මන්ඩලය අද පවතින ආකාරයෙන් පවත්වා ගෙන" යනු ඇතැයි කියාපෑවේය.

නසසප නායක වික්‍රමබාහු කරුනාරත්න මාර්තු 8 දා *ඉරිදා ලක්බිම* පත්‍රයේ සමස්ත තීරු ලිපියක්ම වෙන්කර තිබුනේ බිල් නිලධාරින්ගේ සංගමය ආරක්ෂා කිරීමටයි. ඔහුගේ තර්කය වූයේ පනත කම්කරුවන්ගේ රැකියා හා සේවා කොන්දේසි ආරක්ෂා කරනු ඇත යන්න නොව, ආන්ඩුව අත සියයට 51ක් කොටස් තබාගැනීම එජාපයේ 2002 පනතට වඩා "අඩු නපුරු" වනු ඇත යන්නයි. "යූඇන්පී පනත ගෝලීය බලවතුන් විසින් ම සොයා බලා ඇති කල පනතක්" බැවින් එය "ලොකු අනතුරක්" යයි ඔහු ප්‍රකාශ කලේය.

ආන්ඩුවේ පනත පිටුපසින් සිටින්නේ ද එම ගෝලීය ආර්ථික බලවේගමය. විදුලි බල අංශයේ සියලු ක්ෂේත්‍ර වෙළඳ පොල බලවේග සඳහා විවෘත කෙරුනු වහාම, තරඟකාරිත්වය හා ලාභ සඳහා වන පොරය, ආන්ඩුවේ හිමිකම කුමන මට්ටමේ පැවතුන ද, වියදම් කප්පාදුව, ප්‍රතිව්‍යුහකරනය සහ රැකියා කප්පාදුව කරා තුඩු දෙනු ඇත. ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර කම්කරුවන්, සංගතකරනයේ හා ආංශික පුද්ගලීකරනයේ සෙසු රූපාකාරවල බලපෑම පිලිබඳ කටුක අත්දැකීම් බොහොමයක් දැනටමත් අත්විඳ ඇත.

නසසප වර්තමානයේ දී එම දක්ෂිනාංශික එජාපය සමග සන්ධානයක් ගොඩනගමින් සිටින බැවින් කරුනාරත්නගේ අදහස් වඩාත්ම දෙබිඩි පිලිවෙතක් පෙන්නුම් කරයි. යලිත් තර්කය එකම ය -- එනම්, ශ්‍රීලනිප-නායකත්වයෙන් යුක්ත ආන්ඩුවේ “ආඥාදායක පාලනයට” හා දෙමල සුලුතරයට එරෙහි එහි යුද්ධයට සන්සන්දනාත්මකව එජාපය “අඩු නපුර” නියෝජනය කරයි යන්නය. තථ්‍ය වසයෙන් ගත් කල, එජාපය රාජපක්ෂගේ යුද්ධයට මුලුමනින් ම සහාය දෙන අතර මොන යම් හෝ විරුද්ධත්වයක් පාගාදැමීමෙහිලා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම යොදාගැනීම සම්බන්ධයෙන් ස්වකිය දිගුකාලීන වාර්තාවක් එයට පවතී.

නසසපයේ වඩවඩා විනිවිඳ පෙනෙන උපාමාරුවල අරමුන වන්නේ, ශ්‍රී ලංකාවේ ධනේශ්වරයේ පක්ෂවලින් බිඳී සමාජවාදී වැඩපිලිවෙලක් මත පාදකව ස්වකීය පන්ති අවශ්‍යතා ආරක්ෂා කරගනු වස් ස්වාධීනව බලමුලුගැන්වීමෙන් කම්කරු පන්තිය වලකාලීමය. එහෙත් හරියටම අවශ්‍ය එයයි. සිය රැකියා සහ සේවා කොන්දේසි ආරක්ෂා කරගනු වස්. ලංවිම කම්කරුවෝ, තමන් මෙන්ම ජීවන තත්වයන් මත එල්ල වන ප්‍රහාරයන්ට මුහුන දෙන, ශ්‍රී ලංකාවේ හා ඉන් ඔබ්බෙහි සෙසු කම්කරු කොටස් සහ ග්‍රාමීය ජනතාව දෙසට හැරිය යුතුය.

කම්කරු පන්තියේ එකමුතුව ගොඩනැගීම, අන් සියල්ලටමත් වඩා, දේශපාලන ප්‍රශ්නයකි. කම්කරුවෝ වැඩ කරන ජනතාව භේද කිරීමට යොදා ගන්නා වර්ගෝත්තමවාදය හා ජාතිකවාදය ප්‍රතික්ෂේප කල යුතුය. එයින් අදහස් කෙරෙන්නේ, දිවයින තුල වාර්ගික ආතතීන් අවුලුවාලනු වස් වසර 25ක් තිස්සේ ගසාකනු ලැබ ඇති දෙමල ජනයාට එරෙහි යුද්ධයට විරුද්ධ වීමයි. උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා මිලිටරිය වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීමේ ඉල්ලීම මතු කල යුතුය. එය වනාහි දෙමල, සිංහල හා මුස්ලිම් කම්කරුවන්ගේ එකමුතුව ගොඩනගනු වස් අවශ්‍ය අත්‍යවශ්‍ය පූර්වකොන්දේසියයි.

බස්නාහිර පලාත් සභා මැතිවරනයේ දී කොලඹ දිස්ත්‍රික්කය සඳහා අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් කර සිටින සමාජවාදී සමානතා පක්ෂය සටන් වදින්නේ එම වැඩපිලිවෙල සඳහාය. ගැඹුරු වන ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ ආන්ඩුව වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම්වලට හා ජීවන මට්ටම්වලට එරෙහිව ප්‍රහාරයක් සූදානම් කරන බවට අපි අනතුරු අඟවමු. සමාජවාදී පිලිවෙත් මත පාදක වූ කම්කරු-ගොවි ආන්ඩුවක් -- දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් -- සඳහා අරගලය මගින් එයට ප්‍රතිචාර දැක්විය යුතුය. අපගේ දේශපාලන වැඩපිලිවෙල අධ්‍යනය කොට, අපගේ උද්ඝෝෂනයට සහයොගය දෙන ලෙසත් සසපට බැඳී එය ගොඩනැගීමට එක්වන ලෙසත් ලංවිම කම්කරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.